ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක - 04/2023

(25)

මගේ අංක - HA/02/26/03/10
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය,
" නිල මැදුර ", ඇල්විටිගල මාවත,
කොළඹ 05.
2023.01.24

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

<u>සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීම - 2022</u>

2022 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් හඳුනාගැනීම - 2022 වැඩසටහන ආරම්භ කර ඇත. මෙම වැඩසටහනේ පළමු අදියර ලෙස අදාළ පුද්ගලයන්ගෙන් අයදුම්පත් ලබා ගැනීම හා දත්ත පද්ධතිගත කිරීම සාර්ථකව නිම කර ගැනීම උදෙසා සහය ලබා දීම සම්බන්ධයෙන් කෘතඥතාවය පළ කරමි.

02. මෙම වැඩසටහනේ දෙවන අදියර ලෙස 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ පනවා ඇති 2022 අංක 01 දරණ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් (ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝගය හා 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන පරිදි පනවා ඇති 2022 අංක 02 දරණ ඒකාබද්ධ පද්ධති නියෝගය අනුව ප්‍රතිලාභ ලබා දීම සඳහා අයදුම්කරුවන්ගේ ප්‍රකාශ නිවැරදිව ලබා ගත යුතුව ඇත. ඒ අනුව, සංගණන නිලධාරීන් විසින් එම අයදුම්කරුවන්ගේ පදිංචි නිවාස වෙත ගොස් අයදුම්කරුවන් විසින් කරනු ලබන ප්‍රකාශ නිවැරදිව ලබා ගත යුතුය.

03. තවද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඇති ප්‍රායෝගික ගැටලු සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් ලද ඉල්ලීම් පරිදි, වැඩසටහනට අදාළව පහත පරිදි සංශෝධනයන් සිදු කිරීමට අංක 23/0102/604/009 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් සහ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/WBB/General/01 හා 2023.01.19 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.

I. දැනට බෙදා හැර ඇති "දත්ත ඇතුළත් කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ මාර්ගෝපදේශ අත්වැල" මුද්‍රණයෙහි සඳහන් කරන ලද 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 21 සහ 22 වගන්තිවලට අදාළ මෘදුකාංගයට ඇතුළත් කර තිබූ ප්‍රකාශය ඉවත් කිරීම.

II. 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව සත්‍ය හා නිවැරදි තොරතුරු නොසැපයීම හේතුවෙන් අයදුම්කරුට එරෙහිව නීතිමය වශයෙන් කටයුතු කළ හැකි බව පැහැදිලි කර දෙන ප්‍රකාශයක් මෘදුකාංගයේ සඳහන් කිරීම. එනම්,

"සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේ තොරතුරු සමීක්ෂණයට අදාළ සුබසාධක ප්‍රතිලාභ පනතේ 20 වන වගන්තිය මට හොඳින් පැහැදිලි කර දුන් අතර එම විධිවිධානවලට එකඟව සත්‍ය හා නිවැරදි තොරතුරු මා විසින් ලබා දුන් බව සහතික කරමි."

සහ

"මා විසින් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේ තොරතුරු සමීක්ෂණයට අදාළ සුබසාධක ප්‍රතිලාභ පනතේ 20 වගන්තිය හොඳින් කියවා අයදුම්කරුට පැහැදිලි කර දුන් බව සහතික කරමි."

III. QR කේතයේ සඳහන් කර තිබූ ප්‍රකාශය පහත සඳහන් පරිදි වෙනස් කර ඇත.
"අයදුම්කරුවන් විසින් සපයන ලද දත්ත නිවැරදි ලෙස මෘදුකාංගයට ඇතුළත් කළෙමි."

IV. අයදුම්කරුවන්ගේ ප්‍රකාශ ලබා ගැනීම වෙනුවෙන් එක් අයදුම්පතක් සඳහා රු.300/= බැගින් වූ ප්‍රවෝත්සහන දීමනාවක් ලබා දීම.

V. i phone හැර ජංගම දුරකථනද දත්ත රැස් කිරීම සඳහා යොදා ගත හැකි වන පරිදි මෘදුකාංගය වෙනස් කිරීම.

04. දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන සියලුම කාර්ය මණ්ඩලය යොදා ගෙන ඔවුන් පරිහරණය කරන ජංගම දුරකථන භාවිතා කරමින් හා දැනට පිළියෙල කර ඇති දත්ත රැස් කිරීම සඳහා ඇති පරිගණක මෘදුකාංගය භාවිතා කරමින් මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන්ගෙන් ප්‍රකාශනයක් ලබා ගැනීමට ප්‍රමුඛතාවය දී මෙම කාර්යය මසක් ඇතුළත අවසන් කිරීමට පියවර ගත යුතුය. මීට අමතරව සුභසාධක ප්‍රතිලාභ පනත යටතේ පනවා ඇති 2022 අංක 01 දරණ සුභසාධක ප්‍රතිලාභ ගෙවීම් නියෝගය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සලකා බැලූ 2023.01.10 දින පැවති රාජ්‍ය මූල්‍ය පාර්ලිමේන්තු කාරක සභාව විසින් මෙම වැඩසටහනෙහි දත්ත රැස් කිරීමට අදාළව උද්ගත වී ඇති ගැටලු විසඳාගෙන කඩිනමින් මෙම වැඩසටහන නිමා කිරීමටත් පියවර ගන්නා ලෙසද නියම කර තිබේ.

05. තවද, මෙම වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා මේ මොහොතේ ඡන්ද විමසීමේ කාල සීමාවක් ප්‍රකාශයට පත් කර ඇති හෙයින් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

06. ඒ අනුව 2022 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ විධිවිධාන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩල තීරණ අංක WBB/2020/16/BP/04 යටතේ WBB/General/2022 හා 2022.08.22 දිනැති ලිපිය මඟින් ඔබ වෙත පවරා ඇති බලතල අනුව කටයුතු කර මෙම වැඩසටහන සාර්ථකව සිදු කිරීමට ඔබ සියලු දෙනාගේ නොමඳ සහයෝගය අපේක්ෂා කරමි.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය : +94 11 2050363
ෆැක්ස් : +94 11 2369832
විද්‍යුත් ලිපිනය : diviadmin@moha.gov.lk

CS CamScanner